මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. සහ එහි පරිපාලිතයන් - 2024

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ ප්‍රකාශනය, විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශ ගත ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති තොරතුරුවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. හි ("සමාගම") මූල්‍ය ප්‍රකාශන සහ සමාගමේ සහ එහි පරිපාලිතයේ ("සමූහය") හි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය සිදු කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනය සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගමක සහය මා ලබා ගන්නා ලදී.

සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ හා සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම්

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන ඇපවීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනයන් මාගේ විගණකගේ වාර්තාවේ දින තෙක් ලබාගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාල ලිඛිත නීතියකට හෝ සමූහයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමූහය ක්‍රියා කර ඇති බව;

- සිය බලතල, කර්තව්‍ය හා කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව;

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස හා ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.5.1 ලැබිය යුතු දෑ

<table>
<tr><th></th><th>විගණන නිරීක්ෂණය</th><th>කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම</th><th>නිර්දේශය</th></tr>
<tr><td>(අ)</td><td>වංචනික ක්‍රියාකාරකම්වල යෙදුනු කාර්ය මණ්ඩල සාමාජිකයෙකුගෙන් අයකරගත යුතු ශේෂයක් සේවක ලැබියයුතු ලෙස පෙන්වා තිබුණි.එකතුව රු.මිලියන 43.44 ක් වූ දිගු කාලීන සේවක ලැබිය යුතු හිඟ ශේෂයක් නිරීක්ෂණය වූ අතර ඒවා වර්ෂ 1 සිට වර්ෂ 5 ක කාලසීමාවක් දක්වා හිඟව පවතී. එම දීර්ඝ කාලීන හිඟ සේවක ලැබිය යුතු ශේෂයන් පිළිබඳ කාල විශ්ලේෂණය පහත වගුවේ දක්වා ඇත.
<table>
<tr><th>විස්තරය</th><th colspan="3">හිඟ කාලසීමාව (වර්ෂ)</th></tr>
<tr><th></th><th>1-3
(රු.මි.)</th><th>3-5
(රු.මි.)</th><th>එකතුව
(රු.මි.)</th></tr>
<tr><td>සේවක ලැබිය යුතු</td><td>4.70</td><td>38.74</td><td>43.44</td></tr>
</table>
</td><td>රු.මිලියන 43.44 අතරින් ,2024.12.31 දිනට සමාගම විසින් රු. මිලියන 39.41 ක් සඳහා ප්‍රතිපාදනය කර ඇත. අදාල සේවකයන්ගෙන් අයකර ගැනීමට නීතිමය කටයුතු සිදු කර ක්‍රියාත්මක වෙමින් පවතී.</td><td>සුදුසු නීතිමය හා විනය පියවර ඇතුළුව දීර්ඝ කාලීන සේවක ලැබිය යුතු හිඟ ශේෂයන් නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු කල යුතු බව නිර්දේශ කෙරේ.
අයකරගත නොහැකි යැයි සැලකෙන විට, වර්ධන ක්‍රියාපටිපාටි සහ විභව කපාහැරීම් ද ඇතුලත්ව එවැනි හිඟ මුදල් අයකර ගැනීම සඳහා සමාගම විසින් පැහැදිලි ප්‍රතිපත්තියක් සහ කාලරාමුවක් ස්ථාපිත කළ යුතුය.
අනාගතයේදී එවැනි සිදුවීම් නැවත ඇතිවීම වැළැක්වීම සඳහා අභ්‍යන්තර පාලනයන් ශක්තිමත් කිරීම සහ ගනුදෙනු සහ සිදුවීම් නිතිපතා අධීක්ෂණය කිරීම ද අත්‍යවශ්‍ය වේ.</td></tr>
</table>

1.5.2 ගෙවිය යුතු දෑ

විගණන නිරීක්ෂණය

(අ) හඳුනා නොගත් සෘජු තැන්පතු, ඉදිරිපත් නොවූ ගෙවීම්, පාරිභෝගික එකතු කිරීමේ ගිණුම, උපචිත වියදම් හා මියගිය ගනුදෙනුකරුවන්ගේ ගෙවිය යුතු තැන්පතු ගිණුම්වලට අදාලව වර්ෂ 1 සිට වර්ෂ 5 ට වැඩි කාලසීමාවක් සඳහා එකතුව රු. මිලියන 74.45 ක දීර්ඝ කාලයක සිට හිඟව පවතින ගෙවිය යුතු ශේෂ නිරීක්ෂණය විය. එම දීර්ඝ කාලීන හිඟ ගෙවිය යුතු ශේෂයන් පිළිබඳ කාල විශ්ලේෂණය පහත වගුවේ දක්වා ඇත.

විස්තරය	හිඟ කාලසීමාව (වර්ෂ)			
	1-3 (රු.ම)	3-5 (රු.ම)	5 ට වැඩි (රු.ම)	එකතුව (රු.ම)
හඳුනා නොගත් සෘජු තැන්පතු	4.11	6.85	-	10.96
ඉදිරිපත් නොවූ ගෙවීම්	0.40	0.34	0.04	0.78
පාරිභෝගික එකතු කිරීමේ ගිණුම	1.91	0.09	51.19	53.19
උපචිත වියදම්	7.39	-	-	7.39
මියගිය ගනුදෙනුකරුවන්ගේ ගෙවිය යුතු තැන්පතු	1.46	0.67	-	2.13
එකතුව	**15.27**	**7.95**	**51.23**	**74.45**

කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම

සාමාන්‍ය ලෙජරයේ දිගුකාලීන හිඟ ශේෂයන් නිශ්කාශනය කිරිම සඳහා මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රතිපත්තියට අනුකූලව, එවැනි ශේෂයන් විසඳීම සඳහා සමාගම නිතිපතා ක්‍රියාමාර්ග සිදු කරනු ලබයි. මෙම ක්‍රියාවලියේ කොටසක් වශයෙන් පිළිගත හැකි නිර්දේශ හා අනුමැතීන්ට යටත්ව, වසර 5 ක් ඉක්මවන ඕනෑම නොගෙවූ ශේෂයක් ලියාහරිනු හෝ ආපසු ලියනු ලැබේ.

2024 දෙසැම්බර් 31 දිනට පාරිභෝගික එකතු කිරීමේ ගිණුමේ රු.මිලියන 53.19 ක මුළු හිඟ ශේෂයක් පිළිබිඹු කරයි. මෙයින් සැලකිය යුතු කොටසක් වන රු.මිලියන 50.7 ක් නවරා කැපිටල් පුද්ගලික සමාගමෙන් ලද අරමුදල් වලට අයත් වේ.මෙම අරමුදල් වර්ෂ කීපයකට පෙර එකතු කරන ලද ඒවා වන අතර පවතින නඩු කටයුතු හේතුවෙන් තවමත් නොවිසඳී පවතී.

නිර්දේශය

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රතිපත්තිය අනුගමනය කරමින්, දීර්ඝ කාලීන හිඟව පවතින ගෙවිය යුතු ශේෂ නිරවුල් කළ යුතු බව නිර්දේශ කෙරේ. තවද, සමාගම විසින් නීතිමය ක්‍රියාමාර්ග සක්‍රීයව අධීක්ෂණය කළ යුතු අතර විසඳුම කඩිනම් කිරීම සඳහා අදාළ පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධ විය යුතුය.

ශේෂයන් අයකර ගත නොහැකි හෝ තවදුරටත් ගෙවිය නොහැකි බවට තහවුරු කර ඇති විට, ප්‍රතිපත්තියට අනුකූලව සහ අවශ්‍ය අනුමැතියන්ට යටත්ව සුදුසු කපා හැරීමේ ක්‍රියාමාර්ග ආරම්භ කළ යුතුය.

අභ්‍යන්තර සැසඳුම් ක්‍රියාවලීන් ශක්තිමත් කිරීම සහ එවැනි ශේෂයන් නිරවුල් කිරීමේ කාලෝචිතභාවය වැඩි දියුණු කිරීම අනාගතයේදී සමාන ගැටළු එකතුවීම වැළැක්වීමට උපකාරී වේ.

1.5.3 අත්තිකාරම්

විගණන නිරීක්ෂණය

(අ) 2024 දෙසැම්බර් 31 වන දිනට ප්‍රධාන අක්‍රීය ගණුදෙනුකරුවන් 10 දෙනාගේ හිඟ ශේෂ එකතුව රු. මිලියන 1,578.82 ක් වන අතර එය එදිනට සමාගමේ මුළු අක්‍රීය දළ ණය හා අත්තිකාරම් වලින් සියයට 26.77 ක් නියෝජනය කරයි. විස්තර පහත දැක්වේ.

අංකය	ගණුදෙනුකරුගේ නම	මුළු හිඟ මුදල (රු. මිලියන)
1	මැග් ස්ටෝරේජ් බැටරි (පුද්) සමාගම	387.02
2	කෝපරේට් රිස්ක් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් (පුද්) සමාගම	350.68
3	ඒ පී ඒ ජුවලරි (පුද්) සමාගම	259.68
4	කෙන්ට් හයිඩ්‍රෝ (පුද්) සමාගම	173.84
5	වෝකර්ස් සන්ස් ඇන්ඩ් කම්පැනි ඉංජිනියරින් (පුද්) සමාගම	104.79
6	දයා ගෘප් (පුද්) සමාගම	65.50
7	සීගිරිය වයිස්රෝයි හොටෙල් (පුද්) සමාගම	63.73
8	ඩබ්ලිව්.ජේ.ආර්.ප්‍රනාන්දු මිය	61.94
9	ආචාර්ය යූ.ජී.එ්.ප්‍රනාන්දු	57.58
10	ආර්.ඒ.එල්.විමලදාස මයා	54.06
එකතුව		**1,578.82**

කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම

1. මැග් ස්ටෝරේජ් බැටරි (පුද්) සමාගම

නීතිමය විසඳුමක් සොයමින් සිටී. නඩුව විභාග වෙමින් පවතී.

2.කෝපරේට් රිස්ක් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් (පුද්) සමාගම

එම්බීඑස්එල් ආයතනයට පක්ෂව අධිකරණ තීන්දුවක් ලබා දී ඇත. ගණුදෙනුකරු සමග නිරවුල් කරගැනීමේ සාකච්ඡා කෙරෙමින් පවතී.

3.ඒ පී ඒ ජුවලරි (පුද්) සමාගම

මේ දක්වා රු.මිලියන 105 ක මුදලක් නිරවුල් කිරීම සඳහා එකතු කර ඇත.

4. කෙන්ට් හයිඩ්‍රෝ (පුද්) සමාගම

සේවාදායකයා සෑම මසකම රු. 5,585,000 ක මාසික වාරිකයක් ගෙවයි.

5. වෝකර්ස් සන්ස් ඇන්ඩ් කම්පැනි ඉංජිනියරින් (පුද්) සමාගම

හිඟ ශේෂය සම්පූර්ණයෙන් නිරවුල් කර ඇත.

6. දයා ගෘප් (පුද්) සමාගම

බේරුම්කරණ කොන්දේසි උල්ලංඝනය කර ඇත. රිට් පෙත්සමක් ගොනු කිරීමට නියමිතය.

නිර්දේශය

අක්‍රීය ගණුදෙනුකරුවන්ගෙන් ඉතිරි හිඟ මුදල අයකර ගැනීමට සමාගම විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය බව නිර්දේශ කෙරේ. තවද, ඉහළ වටිනාකමක් ඇති අක්‍රිය ගනුදෙනුකරුවන් නැවත ඇතිවීම අවම කිරීම සඳහා ණය අවදානම් තක්සේරු ක්‍රියාවලීන් ශක්තිමත් කිරීම, පසු- වියපැහැදම් අධීක්ෂණය වැඩිදියුණු කිරීම සහ පූර්ව අනතුරු ඇඟවීමේ යාන්ත්‍රණයන් වැඩිදියුණු කිරීම අත්‍යවශ්‍ය වේ.

7. සීගිරිය වයිස්රෝයි හොටෙල්ස් (පුද්) සමාගම
තෝරාගත් ගැනුම්කරුවෙකුට අත්පත් කරගත් දේපල විකිණීමට එකඟ වී ඇත. ගනුදෙනුව 2025 දෙසැම්බර් වන විට අවසන් කිරීමට නියමිතය.

8.ඩබ්ලිව්.ජේ.ආර්.ප්‍රනාන්දු මිය
මණ්ඩලය විසින් අනුමත කරන ලද බේරුම්කරණ සැලැස්මට අනුව කොටස් පියවීම් හරහා එකඟ වූ බේරුම්කරණය සිදු කෙරේ. 2025 දෙසැම්බර් වන විට හිඟ මුදල් සම්පූර්ණයෙන්ම ගෙවිය යුතුය.

9. ආචාර්ය යූ.ජී.එර්.ප්‍රනාන්දු
මීළඟ නඩු විභාගය සඳහා 2025 දෙසැම්බර් 16 වන දිනට නියම කර ඇත. ගනුදෙනුකරු සමඟ බේරුම්කරණය සඳහා සාකච්ඡා කෙරෙමින් පවතී.

10. ආර්.ඒ.එල්.විමලදාස මයා
නඩු 2ක් ගොනු කර ඇත. එක් නඩුවක් 2025/10/21 දින සහ අනෙක 2026/01/12 දින නඩු විභාගයට කැඳවා ඇත. ගනුදෙනුකරු සමඟ බේරුම්කරණය සඳහා සාකච්ඡා කෙරෙමින් පවතී.

(ආ) 2024 දෙසැම්බර් 31 දිනට සමාගමේ මුළු දළ ණය කළඹේ එකතුව රු. මිලියන 30,274.94 ක් වූ අතර එහි සැලකිය යුතු සාන්ද්‍රණයක් කල් බදු (38.63%), උකස් (16.45%) සහ කෙටිකාලීන ණය (15.82%) නිරීක්ෂණය විය. මෙම නිෂ්පාදන කාණ්ඩ තුන පමණක්

වර්තමානයේදී, අපි ක්ෂුද්‍ර ණය, බිල්පත් වට්ටම්, දෛනික එකතු කිරීම, කුලී මිලදී ගැනීම් සහ චෙක්පත් වට්ටම් පහසුකම් අත්හිටුවා

ණය පොතේ තිරසාරභාවය සහ ඔරොත්තු දීමේ හැකියාව සහතික කිරීම සඳහා සමාගම විසින්, මෙම අංශවල කාර්ය

මුළු කළඹෙන් 70% කට වඩා වැඩි ප්‍රමාණයක් නියෝජනය කරන අතර, එය සාපේක්ෂව ඉහළ නිෂ්පාදන සාන්ද්‍රණ අවදානමක් පෙන්නුම් කරයි.
සමාගමේ මුළු ණය කළඹෙහි නිෂ්පාදන අනුව විශ්ලේෂණය පහත පරිදි වේ.

නිෂ්පාදනයේ නම	**2024 දෙසැම්බර් 31 දිනට මුළු දළ ණය කළඹ (රු.මිලියන)**	**දළ ණය කළඹට ප්‍රතිශතය %**
කල්බදු	11,696.54	38.63
කුලියට මිලදී ගැණුම්	275.75	0.91
Closure type 10-කල්බදු	8.95	0.03
කාලීන ණය	3,770.37	12.45
නිවාස ණය	43.02	0.14
වාහන ණය	77.04	0.25
කාර්යමණ්ඩල කාර් ණය	147.87	0.49
කාර්යමණ්ඩල අධ්‍යාපන ණය	0.03	0.00
කාර්යමණ්ඩල නිවාස ණය	0.26	0.00
කාර්යමණ්ඩල පුද්ගලික ණය	49.64	0.16
කෙටිකාලීන ණය	4,790.17	15.82
ක්ෂුද්‍ර මූල්‍ය	261.95	0.87
පුද්ගලික ණය	876.56	2.90
දෛනික එකතු කිරීම	69.56	0.23

ඇත.
එම්බීඑස්එල් දැඩි පාලනයක් සහිතව ණය අත්තිකාරම් වර්ධනය කිරීම අඛණ්ඩව සිදු කරන අතර වර්තමාන ණය පොත රු.38,795,439,104 ක් වේ.
කල්බදු , කෙටිකාලීන ණය, වාහන ණය, ඊසි ඩ්‍රාෆ්ට්ස් (Easy Drafts), හා කාලීන ණය වර්ධන අවධියේ ප්‍රධාන නිෂ්පාදන වේ. දැඩි ණය ඇපකරයක් සමග මුදල් ප්‍රවාහ සහ අයකරගැනීම් පිළිබඳ අඛණ්ඩ පසු විපරමක් මගින් ශක්තිමත් කළඹක් සහතික කර ඇත.

සාධනය, ණය අවදානම් නිරාවරණය සහ අයකර ගැනීමේ ප්‍රවණතා පිළිබඳ පුළුල් සමාලෝචනයක් සිදු කිරීම නිර්දේශ කෙරේ.ඊට අමතරව, නිවාස ණය, ක්ෂුද්‍ර මූල්‍ය සහ බිල්පත් වට්ටම් වැනි නියෝජනය අඩු නමුත් ශක්‍ය නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීමෙන් කළඹ විවිධාංගීකරණය කිරීමට උත්සාහ කළ යුතුය. හොඳ ණය ඇගයීම සහ වෙළඳපල විශ්ලේෂණය මගින් සහාය වන මෙම විවිධාංගීකරණය,කළඹෙහි ස්ථායිතාව වැඩි දියුණු කරන අතර නිෂ්පාදන වර්ග කිහිපයක් මත අධික ලෙස රඳා පැවතීම අඩු කරනු ලබන අතර, එමගින් සමාගමේ සමස්ත අවදානම් කළමනාකරණ රාමුව ශක්තිමත් කරයි.

බිල්පත් වට්ටම් කිරීම	456.53	1.51
චෙක්පත් වට්ටම් කිරීම	75.11	0.25
උකස්	4,981.10	16.45
තැන්පතු එරෙහි ණය	688.27	2.27
දේපල වෙළඳාම් ණය	16.93	0.06
ආන්තික වෙළඳාම	1,989.29	6.57
එකතුව	**30,274.94**	**100.0**

1.5.4 තොරතුරු තාක්ෂණ සාමාන්‍ය පාලන

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	උපස්ථ කළමනාකරණ කාර්යය සම්බන්ධයෙන් ප්‍රමාණවත් ලෙස ලේඛනගත කර අනුමත කරන ලද සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි (SOP) නොමැතිකම, උපස්ථ කළමනාකරණ ක්‍රියාවලිය හැසිරවීමේදී අනනුකූලතාවය සහ දෝෂ වැනි අවදානම් සාධක කිහිපයක් සමාගමට ඉදිරිපත් කරයි. තවද, සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි ලියකියවිලි නොමැතිව, උපස්ථ කළමනාකරණ මෙවලම නොගැලපෙන හෝ අකාර්යක්ෂම ලෙස භාවිතා කිරීමේ අවදානමක් පවතින අතර, එමගින් ලේඛන නොමැතිව ස්ථාපිත ක්‍රියාවලිය සඳහා කාර්ය මණ්ඩල සාමාජිකයින් පුහුණු කිරීමේදී සංකූලතා ඇති විය හැකිය.	තොරතුරු තාක්ෂණ විගණකවරුන් විසින් මතු කරන ලද තොරතුරු තාක්ෂණ විගණන සැලකිල්ලට අනුව, තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව Veeam උපස්ථ විසඳුම ක්‍රියාත්මක කර ඇත. එබැවින්, Veeam උපස්ථ විසඳුමේ උපස්ථ ක්‍රියාවලියට අනුව, තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව ඒ සඳහා වන සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි (SOP) ලේඛනය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියක යෙදී සිටින අතර එය ඊළඟ තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කමිටුවට ඉදිරිපත් කර (නොවැම්බර් මාසයේදී පැවැත්වෙන 27 වන	නව උපස්ථ විසඳුම හා සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි ලේඛනය වැඩිදියුණු කිරීම තුලින් උපස්ථ කළමනාකරණ ක්‍රියාවලියේ අවදානම් සාධක අවම කිරීමට නිර්දේශ කෙරේ.

		තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කමිටු රැස්වීම) අවසන් කිරීමට නියමිතය.	
(ආ)	ආරක්ෂක මෙහෙයුම් මධ්‍යස්ථානයක් (SOC) සමාගමකට අත්‍යවශ්‍ය වන්නේ එය තත්‍ය කාලීනව ආරක්ෂක තර්ජන නිරීක්ෂණය කිරීම, හඳුනා ගැනීම සහ ප්‍රතිචාර දැක්වීම සඳහා විසඳුමක් සපයන බැවිනි. සමාගම තුළ ආරක්ෂක මෙහෙයුම් මධ්‍යස්ථානයක් නොමැති විට, එය අඛණ්ඩ ප්‍රහාර පිළිබඳව සීමිත දෘශ්‍යතාවයක් තිබිය හැකි අතර, එමඟින් ප්‍රහාරකයින්ට පද්ධති අවදානමට ලක් කිරීමට සහ සංවේදී දත්ත සොරකම් කිරීමට පහසු වේ.	වර්තමානයේදී, අපි දැනටමත් FINCSIRT ISOC සේවාව සහ තර්ජන බුද්ධි සේවා සමඟ සම්බන්ධ වී ඇති අතර, 24/7/365 SOC සේවාවක් සඳහා වන අවශ්‍යතාවය සපුරාලීමට, කළමනාකරණය කරන ලද ආරක්ෂක මෙහෙයුම් මධ්‍යස්ථානයක් (SOC) සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර ඇත. ආරක්ෂක මෙහෙයුම් මධ්‍යස්ථානය (SOC) 2026 පළමු කාර්තුව වන විට ක්‍රියාත්මක කෙරේ.	ආරක්ෂක තර්ජන අවම කිරීම සඳහා ආරක්ෂක මෙහෙයුම් මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමට නිර්දේශ කෙරේ.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 240.4 ක ලාභයක් වූ අතර පෙර වර්ෂයේ එයට අනුරූප ලාභය රු. මිලියන 20.8 ක් විය. එබැවින් මූල්‍ය ප්‍රතිඵලයේ රු. මිලියන 219.6 ක වැඩිදියුණුවීමක් නිරීක්ෂණය විය. පෙර වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මුළු මෙහෙයුම් ආදායම රු. මිලියන 975.6 කින් වැඩිවීම මෙම වැඩිදියුණුවීමට ප්‍රධානම හේතුව විය.

2.2 ප්‍රධාන ආදායම් හා වියදම් අයිතමයන්ගේ ප්‍රවනතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් සහ වියදම් අයිතම පෙර වර්ෂය හා සැසඳීමේ දී වැඩිවීමේ හෝ අඩුවීමේ ප්‍රතිශතය සමග පහත දක්වා ඇත.

විස්තරය	2024 (රු. '000)	2023 (රු.'000)	වෙනස (%)	විචලනයට හේතුව
පොළිය සහ සමාන ආදායම	6,207,886	6,559,123	(5.35)	ප්‍රධාන වශයෙන් ක්‍රමක්ෂය කළ පිරිවැය යටතේ ණය සහ ලැබිය යුතු මුදල් සඳහා වෙළඳපොළ අනුපාතවලට සාපේක්ෂව පොලී අනුපාත අඩුවීම සහ බැංකු සහ මූල්‍ය ආයතන සමඟ ස්ථානගත කිරීම හේතුවෙන් පොලී ආදායම සුළු වශයෙන් අඩු වී ඇත.
පොළිය සහ සමාන වියදම	4,021,096	4,918,658	(18.2)	තැන්පතු පදනමේ සහ සමාගමේ ණය ගැනීම් සඳහා වන පොළී අනුපාත අඩුවීම පොළී වියදම අඩුවීමට හේතු වී තිබුණි.
ගාස්තුව සහ කොමිස් ආදායම	211,880	123,292	71.85	2024 වර්ෂය තුල ප්‍රදානය කළ දළ කල්බදු හා ණය වැනි වෙළඳ හා වෙනත් අදාල ක්‍රියාකාරකම්වල වැඩිවීම ගාස්තු සහ කොමිස් ආදායම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.
ශුද්ධ වෙළෙඳ ආදායම	793,811	120,243	560.17	ලාභ අලාභ හරහා සාධාරණ වටිනාකමකින් යුත් මූල්‍ය වත්කම් බැහැර කිරීමෙන් වන ලාභය ඇතුළුව වෙළඳ ක්‍රියාකාරකම් තුලින් ප්‍රතිඵලය වැඩිවී තිබුණි.
වෙනත් මෙහෙයුම් ආදායම	111,819	116,167	(3.74)	දේපළ වෙළඳාම් වලින් ලැබෙන ලාභ හා අලාභ අඩුවීම, ආශ්‍රිත සමාගම් වලින් ලැබෙන ලාභාංශ ආදායම අඩුවීම සහ ලියා හරින ලද බොල් ණය අයකර ගැනීම සහ දේපළ හා උපකරණ බැහැර කිරීමෙන් ලැබෙන ලාභ වැඩි වීම හේතුවෙන් අනෙකුත් මෙහෙයුම් ආදායම අඩු වී තිබුණි.
ණය සහ අනෙකුත් වත්කම් සඳහා හානිකරණ අලාභ ආපසු හැරවීම සඳහා දීමනාව	101,111	25,094	302.92	ණය සහ අනෙකුත් වත්කම් සඳහා වන හානිකරණ අලාභ ආපසු හැරවීම සඳහා දීමනාව ප්‍රධාන වශයෙන් ඉහළ ගොස් ඇත්තේ තනි පුද්ගල සැලකිය යුතු ණය මත හානි වීම වැඩිවීම සහ කපා හැරීම් හේතුවෙන් හා සාමූහික පදනමින් ලබා දෙන හානි අඩුවීම හේතුවෙනි.

2.3 අනුපාත විශ්ලේෂණය

ලබා දී ඇති තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂය සහ පෙර වර්ෂය සඳහා සමාගමේ ඇතැම් වැදගත් අනුපාත ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රසිද්ධ කරන ලද ආංශික අනුපාත වලට සාපේක්ෂව පහත දක්වා ඇත.

විස්තරය	ආංශික අනුපාතය *	සමාගම	
		2024	**2023**
කාර්යසාධන අනුපාත			
හිමිකම් මත ප්‍රතිලාභ (ROE)	13.5	6.37	0.57
වත්කම් මත ප්‍රතිලාභ (ROA)	6.1	0.65	0.06
පොළී ආන්තිකය	10.6	6.52	5.55
වත්කම් තත්ත්ව අනුපාතය			
දළ අක්‍රීය අත්තිකාරම් (NPA)	11.3	13.18	19.32
ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාත			
ස්ථර 1 ප්‍රාග්ධනය (අවම 8.50%)	20.4	11.97	13.60
මුළු ප්‍රාග්ධනය (අවම 12.50%)	21.2	14.45	16.75
ව්‍යවස්ථාපිත අනුපාතය			
ද්‍රවශීල වත්කම් අනුපාතය	11.4	31.19	11.59

*** ආංශික අනුපාත ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවියේ මුල්‍ය අංශය - බලපත්‍රලාභී මුල්‍ය සමාගම් යටතේ උපුටා ගන්නා ලදී.**

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 හඳුනාගත් පාඩු

අංකය	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාගම විසින් සමාලෝචිත වර්ෂය තුළදී, ආපසු අයකර ගැනීමට නොහැකිවීම මත අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ එකතුව රු.මිලියන 108.7 ක් වු අක්‍රිය ණය සහ අත්තිකාරම් 87 ක් ලියා හැර තිබුණි.	අයකරගැනීමේ සියළු විකල්ප ඇගයීමෙන් පසු , කපාහැරීමට නිර්දේශ, අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී.ශේෂයන්ට 2015 ඒකාබද්ධ වු අවස්ථාවේදී උරුම වු කළඹ ද ඇතුලත් වේ. මෙම කපාහරින ලද ශේෂයන් අඛණ්ඩ පදනම මත	ණය හා අත්තිකාරම් ලියා හැරීමට ප්‍රථම ආපසු අයකර ගැනීමට හැකි සෑම ප්‍රයත්නයක්ම ගැනීමට සහ අනාගතයේදී අක්‍රිය ණය ඇතිවීම අවම කිරීම සඳහා එහි

		අයකරගැනීම සඳහා අයකරගැනීම් දෙපාර්තමේන්තුවේ " කපාහැරීම් එකතුකිරීමේ කණ්ඩායම " විසින් තවදුරටත් උත්සාහයන් දරමින් සිටී.	ණය ඇගයීමේ ක්‍රියාවලිය සහ ණය අධීක්ෂණ යාන්ත්‍රණයන් ශක්තිමත් කිරීමට නිර්දේශ කෙරේ.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

අංකය	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 වර්ෂය තුල සමාගම විසින් නැවත අත්කරගත් වාහන 125 ක් අලෙවි කර තිබුණි. කෙසේ වෙතත්, එම වාහන 125 අතරින් වාහන 94 ක් තක්සේරු වාර්තාවේ සඳහන් බල කරන ලද විකුණුම් වටිනාකමට වඩා අඩු මිලකට අලෙවි කර තිබුණි. මෙම ගණුදෙනුවෙන් සමාගමට සිදුවූ සමස්ත පාඩුව රු.28,632,511 කි.	බොහෝ වාහන නඩත්තුවකින් තොරව දිගු කාලයක් රඳවා තිබීම සහ සීමිත දීමනා සහිතව නැවත නැවතත් ප්‍රචාරණය කිරීම සැලකිල්ලට ගනිමින් තවදුරටත් බැහැර කිරීමේ අලාභ අඩු කිරීම සඳහා පවතින ලංසු පිළිගැනීමට " බැහැර කිරීමේ කමිටුව" සාමූහිකව තීරණය කර තිබුණි.	කාලීන විකුණුම්, වෙළඳපල තත්වයන් පිළිබිඹු වන පරිදි කාලානුරූපව ප්‍රත්‍යාගණනය, අත්පත් කරගත් වාහන නඩත්තු කිරීම අවම කිරීම සහ තරඟකාරි ලංසු ආකර්ෂණය කරගැනීම සඳහා පුළුල් අලෙවිකරණ මාර්ග සහතික කිරීම මගින් සමාගම තම වත්කම් බැහැරකිරීමේ ක්‍රියාවලිය ශක්තිමත් කළ යුතු බව නිර්දේශ කරන අතර, එයින් අනාගත වත්කම් බැහැර කිරීමේදී සිදුවන පාඩු අවම කරගත හැක.

(ආ)	ඉහත වාහන 125 අතරින් , වාහන 106 කට අදාලව බැහැර කිරීමේ දිනට මුළු ප්‍රාග්ධන හිඟ වටිනාකම රු.146,867,288 කි. කෙසේ වෙතත්, ගණුදෙනුකරුවන්ගෙන් අයකරගත යුතුව ඇති තවදුරටත් හිඟව පවතින රු.70,242,922 ක ශේෂයක් ඉතිරි කරමින් වාහන බැහැර කිරීමෙන් සමාගමට අයකරගත හැකිවුයේ ප්‍රාග්ධන වටිනාකම රු 76,624,366 ක් පමණි. එබැවින්, වාහන බැහැර කිරීමෙන් පසුව පවා සමාගමට අවම	වාර්තා වී ඇති ඉහළම අලාභයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ සමාගමේ අයකරගැනීමේ විසර්ජන ක්‍රමවේදය වන අතර, ඒ යටතේ ගාස්තු අයකරගැනීම ප්‍රමුඛතාවය ගන්නා අතර ලද ඉතිරි මුදලෙන් 70% ක් ප්‍රාග්ධන අයකිරීම සඳහා සහ 30% ක් පොළියෙන් කොටසක් අයකරගැනීම සඳහා වෙන් කරනු ලැබේ.	සමාගමේ ප්‍රතිපත්තිය අනුගමනය කරමින් සමාගමට සිදුවිය හැකි පාඩු අවම වන පරිදි විචක්ෂණශීලීව තීරණ ගැනීමට නිර්දේශ කෙරේ. එසේම, සමාගම ඉහළ අවදානම් සහිත ගිණුම් සමීපව නිරීක්ෂණය

	වශයෙන් වියපැහැදම් කළ මුදල හෝ අයකර ගැනීමට නොහැකි විය. ඉහත සඳහන් මුදල ගනුදෙනුකරුවන්ගෙන් අයකර ගැනීමට නොහැකිවීම මත සමාගමට පාඩුවක් දැරීමට සිදුවිය හැකි බව නිරීක්ෂණය විය.	සම්පූර්ණ බැහැර කිරීමේ වටිනාකම ප්‍රාග්ධන අයකර ගැනීම සඳහා යොදා ගත්තේ නම්, පාඩුව රුපියල් මිලියන 39.5 දක්වා අඩු වීමට ඉඩ තිබුණි.	කිරීමෙන්, කාලීන අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ආරම්භ කිරීමෙන් සහ සාක්ෂාත් කර ගැනීම් උපරිම කිරීමට සහ අනාගත පාඩු අවම කිරීමට බැහැර කිරීමේ උපාය මාර්ග ප්‍රශස්ත කර ඇති බව සහතික කිරීමෙන් එහි ණය අවදානම් කළමනාකරණය සහ අත්පත් කර ගැනීමෙන් පසු අයකර ගැනීමේ ක්‍රියාවලින් ශක්තිමත් කළ යුතුය.
(ඇ)	අත්කරගත් වාහන අංගනයෙන් බැහැර කිරීමේදී සැලකිය යුතු ප්‍රමාදයන් නිරීක්ෂණය විය. 2025 ජූලි 31 දිනට, අංගනයෙහි නවතා තිබු වාහන 56 ක් අතරින් වාහන 43 ක් දීර්ඝ කාලයක සිට එහි නවතා තිබුණි. එය වර්ෂ ගණනාවක් පුරා අධික නඩත්තු පිරිවැයක් දැරීමටත්, වාහනවල වෙළඳපල වටිනාකම අඩුවීමෙන් පාඩු සිදුවිමටත් හේතුවිය හැක. විස්තර පහත දැක්වේ. **අංගනයේ නවතා තිබු කාලසීමාව** — **වාහන සංඛ්‍යාව** වර්ෂ 1-3 — 04 වර්ෂ 3-5 — 06 වර්ෂ 5 ට වැඩි — 37 **එකතුව** — **47**	2025 ජූලි 31 දිනට, අපගේ අංගනයෙහි වාහන 56 ක් තිබුණි. මෙයින් වාහන 44ක් උසාවි බැඳුම්කර ලෙස වර්ගීකරණය කර ඇති අතර, උසාවි නියෝග මගින් බැඳුම්කර අවලංගු කරන තුරු බැහැර කළ නොහැක. ගනුදෙනුකරුවන් විසින් ගොනු කරන ලද ආර්එම්වී (RMV) විරෝධතා හේතුවෙන් වාහන තුනක් (03) රඳවා තබා ඇති අතර, ඉතිරි වාහන නවයෙන් වාහන හතරක් (04) නිදහස් කර ඇති අතර, වාහන පහක් (05) පමණක් තවමත් අංගනවල රඳවා තබා ඇත.	අත්පත් කරගත් වාහනවල රඳවා තබාගැනීමේ කාලසීමාවන් අවම කිරීම , නඩත්තු වියදම් අඩු කිරීම සහ වෙළඳපල වටිනාකම තවදුරටත් පහත වැටීම වැළැක්වීම සඳහා උසාවි බැඳුම්කර සහ ආර්එම්වී (RMV) විරෝධතා නඩු වලට අදාල නීතිමය හා පරිපාලන ක්‍රියාවලීන් කඩිනම් කිරීමට සමාගමට නිර්දේශ කෙරේ.
(ඇ)	ණය අංකය : 7620941 අරමුණු තුනක් ළඟාකරගැනීම සඳහා සමාගම විසින් 2020 වර්ෂයේදී විශේෂිත ගණුදෙනුකරුවෙකු වෙත රු. මිලියන 8.5 ක කාලීන ණය පහසුකමක් ප්‍රදානය කර තිබුණි. ප්‍රධාන අරමුණ වෙනත්	මෙම ණය මුදල 2025 සැප්තැම්බර් 10 දින සම්පූර්ණයෙන් නිරවුල් කර ඇත.	අනාගතයේදී අක්‍රිය ණය ඇතිවීම අවම කිරීමට ණය පහසුකම් ලබා දීමේදී ණය ප්‍රතිපත්ති උපදෙස් සහ ලේඛනවල

ආයතනයකින් ලබාගත් ණය පියවීමටයි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.		නිරවද්‍යතාවය නිවැරදිව ඇගයීමට ලක් කළ යුතු බව නිර්දේශ කෙරේ.
• ණය අත්පොතෙහි 6.3.2 (2) වගන්තිය ප්‍රකාරව, සමාගම විසින් අත්පොතෙහි සඳහන් පහත කොන්දේසි සහිතව පෙර ණය මුදල තක්සේරු කර නොතිබුණි. ▪ අඛණ්ඩ සතුටුදායක ගෙවීම් ▪ ප්‍රාග්ධනයෙන් 35% කට වඩා ආපසු ගෙවා තිබීම ▪ පහසුකම චක්‍රීය/ප්‍රාග්ධන කෙටිකාලීන පහසුකමක් නම් හිඟ පොළී හැර මුළු ප්‍රාග්ධන හිඟ මුදල් පවරා ගත හැක. ▪ හේතුව ශ්‍රී ලංකා මර්චන්ට් බැංකුවට සාධාරණීකරණය කළ හැක.	අදහස සමඟ එකඟ විය	
• ගණුදෙනුකරුගේ ආපසු ගෙවීම් ධාරිතාවය පිළිබඳ නිසි ඇගයීමක් සිදු කර සහ කිසිදු වලංගු ආදායම් තහවුරුවන ලිපිලේඛන ලබාගෙන ඇගයීමට ලක්කර නොතිබුණි.	අදහස සමඟ එකඟ විය	
• සමාගම 2021 වර්ෂයේදී පහසුකම ප්‍රතිව්‍යුහගත කර ඇති අතර ද්වීතියික උකස් බැඳුම්කරයක් අත්සන් කර ඇත.කෙසේ වුවත්, ද්වීතියික උකස් බැඳුම්කරය දීමනා ලිපියට ඇතුලත් කර නොතිබුණි.	අදහස සමඟ එකඟ විය	
• 2021 වර්ෂයේදී ණය වාරික සඳහා ණය සහන ලබාදී තිබුණද, ණය පද්ධති ලේඛණ අනුව අයදුම්කරු විසින් කරන ලද ඉල්ලීම, තක්සේරුව, ඇගයීම, ප්‍රගතිය වැනි ලිඛිත සාක්ෂි ණය ලිපිගොනුවල නොතිබුණි.	අදහස සමඟ එකඟ විය	

(ඉ) ණය අංකය : 7193199

සමාගම විසින් 2019 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා විශේෂිත ගණුදෙනුකරුවෙකු වෙත කාලීන ණය හා සහන ණය පහසුකමක් ප්‍රදානය කර තිබුණි. පවතින පහසුකම් සඳහා ආපසු ගෙවීම් නොකඩවා සිදු නොවූ බැවින් 2021 වර්ෂයේදී සමාගම විසින් පවතින සියළුම ණය රු. මිලියන 71.5 ක තනි ණයක් බවට පරිවර්තනය කරමින් පහසුකම් ප්‍රතිව්‍යුහගත කර තිබුණි. ප්‍රතිව්‍යුහගත පහසුකම පිලිබඳ පහත නිරීක්ෂණ කරනු ලැබේ.

- ණය ක්‍රියාපටිපාටි අත්පොතෙහි සඳහන් උපදෙස්වලට පටහැනිව උකස් දේපලෙහි බලකරන ලද විකුණුම් වටිනාකම ඉක්මවමින් මුළු ණය මුදල ප්‍රදානය කර තිබුණි.

අදහස සමග එකඟ විය
වසංගත අර්බුදකාරි කාලපරිච්ඡේදය තුළ ගණුදෙනුකරුගේ මුදල් ප්‍රවාහ සීමාවන් සැලකිල්ලට ගනිමින්, LTV අපගමනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පදනම්ව, 2019.06.10 දිනැති රු. මිලියන 71.84 ක දේපල තක්සේරුවේ වෙළඳපල වටිනාකමෙන් 100% ක් දක්වා නිරාවරණය සැලකිල්ලට ගනිමින්, රු.මිලියන 71.5 ක ප්‍රතිව්‍යුහගත කිරීම ප්‍රදානය කරන තිබුණි.

- මූල්‍ය තත්ත්වය තක්සේරු කිරීම සඳහා 2021 වර්ෂයේ විගණිත මූල්‍ය ප්‍රකාශන ලබාගෙන නොතිබුණි.

අදහස සමග එකඟ විය
පහසුකම ලබා දෙන අවස්ථාව වන විට විගණනය අවසන් කර නොතිබූ බැවින්, 2019 සහ 2020 වර්ෂවල විගණනය කරන ලද මූල්‍ය වාර්තා සමග 2021 වර්ෂය සඳහා කළමනාකරණ මූල්‍ය වාර්තා සලකා බලන ලදී.

- 2019 හා 2020 වර්ෂවල මූල්‍ය ප්‍රකාශන අනුව ණය ලබාගත් සමාගම අසතුටුදායක මූල්‍ය කාර්යසාධනයක් වාර්තා කර තිබුණි.

අදහස සමග එකඟ විය.
සපයා ඇති විගණන මූල්‍ය වාර්තාවලින් පිළිබිඹු වන අයදුම්කාර සමාගමේ එම අසතුටුදායක තත්ත්වය, ණය තක්සේරුවේ මූල්‍ය ඉස්මතු කිරීම්

අනාගතයේදී අක්‍රීය ණය ඇතිවීම අවම කිරීමට ණය පහසුකම් ලබා දීමේදී ණය ප්‍රතිපත්ති උපදෙස් සහ ලේඛනවල නිරවද්‍යතාවය නිවැරදිව ඇගයීමට ලක් කළ යුතු බව නිර්දේශ කෙරේ.

		අංක 9.2 වගන්තිය යටතේ සටහන් කර අදහස් දක්වන ලදී. පිටවීමේ සැලැස්මකට මග පෑදීම සඳහා මෙම පහසුකම ප්‍රතිව්‍යුහගත කිරීමක් ලෙස සලකා තිබුණි. පිටවීමේ සැලැස්මකට මූලික කටයුතු කිරීම සඳහා මෙම පහසුකම ප්‍රතිව්‍යුහගත කිරීමක් ලෙස සලකා තිබුණි.	
(ඊ)	2015 වර්ෂයට පෙර ලබාදුන් පහසුකම් වලට අදාලව 2024 දෙසැම්බර් 31 දිනට සමාගම සතුව අත්පත් කරගත් දේපල 14 ක් තිබුණි. පහසුකම් අක්‍රීය තත්ත්වයට පත්වීමෙන් පසුව හිඟ මුදල් අයකරගැනීම සඳහා සමාගම විසින් මෙම දේපල අත්පත්කරගෙන තිබුණි. විගණනය සඳහා ලබාගත හැකිවූ තොරතුරුවලට අනුව, රු.61,151,284 ක් වන හිඟ ප්‍රාග්ධන මුදල දේපල 06 ක් සඳහා පමණක් වේ.	අත්පත් කරගත් දේපල, ණයදෙනුකරුවන් විසින් පැහැර හරින ලද සහ නීතිමය ක්‍රියාමාර්ගවලට පසුව අත්පත් කරගත් පහසුකම්වලට අදාල වේ.එම්බීඑස්එල් විසින් දේපල අත්පත් කරගත් පසු හැකි ඉක්මණින් මෙම දේපල විකිණීමේ වගකීම එම්බීඑස්එල් හි දේපල වෙළඳාම් දෙපාර්තමේන්තුවට පැවරී ඇත. එසේ වුවත්, සමහර ණය ශේෂයන් වසර ගණනාවකට පෙර කපා හැර ඇති අතර, වර්තමානයේ පද්ධතිය තුල කිසිදු ශේෂයක් නොමැත. නීතිමය ආරවුල්, දේපළ සොයා ගැනීමට නොහැකි වීම සහ වෙළඳ දැන්වීම් වලින් පසු දේපළ සඳහා ගැනුම්කරුවන් නොමැති වීම හේතුවෙන් මෙම අත්පත් කරගත් දේපළ විකිණීමට යම් කාලයක් ගතවේ.	අත්පත් කරගත් දේපල විකුණා, හිඟ මුදල් අයකර ගැනීමට සහ කපා හරින ලද ණය ශේෂයන්ට එරෙහිව සමාගමේ ආදායම වැඩි කිරීමට හැකි සෑම උත්සාහයක්ම ගැනීම නිර්දේශ කෙරේ. තවද, ඉතිරිව ඇති වටිනාකමක් අයකර ගැනීමට සහ රඳවාගැනීමේ පිරිවැය අවම කරගැනීම සඳහා සමාගමේ අත්පත් කරගත් දේපල බැහැරකිරීමේ ක්‍රියාවලිය හැකිතාක් කඩිනම් කිරීමට අවශ්‍ය වේ. නීතිමය ආරාවුල් කාලෝචිත ලෙස විසඳීම සහතික කිරීම සඳහා නීති බලධාරින් සමග නිතිපතා පසු විපරම් කිරීම සහ කළමනාකාරිත්වය විසින් වරින් වර සමාලෝචන සිදු කළ යුතුය.විභව ගැණුම්කරුවන් ආකර්ෂණය කරගැනීමට සහ ඉක්මණින් බැහැර

			කිරීමට පහසුකම් සැලසීමට සුදුසු අලෙවිකරණ උපාය මාර්ග ආරම්භ කිරීමට ද උපදෙස් දෙනු ලැබේ.

3.3 ප්‍රසම්පාදන

අංකය	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
	මෙහෙයුම් හා උපායමාර්ගික අවශ්‍යතා සපුරාලීම සඳහා සමාගම විසින් "MINT HRM" නමින් වළාකුළු පාදක මානව සම්පත් කළමනාකරණ පද්ධතියක් රු.5,887,500 ක පිරිවැයකට ප්‍රසම්පාදනය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.		
(අ)	මෙම පද්ධතියට මෙහෙයුම් මොඩියුලය, උපායමාර්ගික මොඩියුලය සහ වන්දි මොඩියුලය වැනි මොඩියුල තුනක් ඇතුළත් වේ. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත කාලරාමුවට අනුව දින 120 ක් ඇතුලත මෙම මොඩියුල ක්‍රියාත්මක කළ යුතුය. MINT HRM පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ ඇස්තමේන්තුගත කාලය හා තථ්‍ය කාලය අතර සැලකිය යුතු කාලරාමු වෙනසක් නිරීක්ෂණය විය.2024 දෙසැම්බර් 31 දින වන විට උප මොඩියුල 17 න් 5 ක් ක්‍රියාත්මක කර නොතිබූ අතර එක් මොඩියුලයක් ලබාගත නොහැකි විය.	සම්පූර්ණ ගෙවීම සිදුකොට නොමැත. වට්ටමක් පිළිබඳ සාකච්ඡා කර ඇත. වැටුප් ගෙවීමේ කාර්යය තෙවන පාර්ශවයකට පවරා ඇති බැවින් වැටුප් මොඩියුලය ක්‍රියාත්මක කර නොමැත.මෙම මොඩියුලයේ භාවිතා නොකරන උප මොඩියුල 2 ක් ඇත. අනෙක් උප මොඩියුල 3, උපායමාර්ගික ප්‍රධාන මොඩියුලයට අදාළ වන අතර, එහිදී වින්‍යාසය MINT HR විසින් සම්පූර්ණ කළ යුතුය. මොඩියුල දෙකක් පමණක් ක්‍රියාත්මක කිරීමට සහ මුල් මිලෙන් රුපියල් 387,500/- ක මිල අඩු කිරීම සඳහා 2025 සැප්තැම්බර් 29 වන දින අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් ලබාගෙන ඇත.	ගිවිසුමකට එළඹීමට පෙර සමාගමේ අවශ්‍යතා සපුරාලීම සහතික කිරීම සඳහා පද්ධතිය පිළිබඳ ශක්‍යතා අධ්‍යයනයක් කිරීමට නිර්දේශ කරනු ලබන අතර, සංශෝධිත පද්ධති ක්‍රියාත්මක කිරීමේ විෂය පථය සහ මිලකරණය, විකුණුම්කරු ගිවිසුමේ සහ අදාළ ගිණුම්කරණ වාර්තාවල නිසි ලෙස පිළිබිඹු වන බවට කළමනාකාරිත්වය සහතික කළ යුතුය.
(ආ)	එකඟ වූ ගෙවීම් නියමයන්ට අනුව, සියළුම මොඩියුල සාර්ථකව ක්‍රියාත්මක කර තහවුරු කළ පසුව ගෙවීම් වලින් සියයට 70 ක් සිදු කළ යුතුය. 2024 දෙසැම්බර් 31 දින දක්වා මොඩියුල 17 න් 6 ක් ආරම්භ කර	මොඩියුල දෙකක් පමණක් ක්‍රියාත්මක කිරීමට සහ මුල් මිලෙන් රුපියල් 387,500/- ක මිල අඩු කිරීම සඳහා 2025 සැප්තැම්බර් 29	සමාගමේ අරමුදල් ආරක්ෂා කරගැනීම සඳහා, එකඟ වූ සන්ධිස්ථාන සහ සම්පූර්ණ කිරීමේ

නොතිබුණද, 2023 අගෝස්තු දක්වා ගෙවීම්වලින් සියයට 70 ක් වියපැහැදම් කර තිබුණි.	වන දින අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් ලබාගෙන ඇත. මෙහෙයුම් මොඩියුල දැනට මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් සම්පූර්ණයෙන්ම භාවිතා කරනු ලැබේ.	තහවුරු කිරීම් වලට අනුකූලව අනාගත පද්ධති ක්‍රියාත්මක කිරීමේ ගෙවීම් දැඩි ලෙස සිදුකරන බවට කළමනාකාරිත්වය සහතික කළ යුතුය. ව්‍යාපෘති විෂය පථයට හෝ ගෙවීම් නියමයන්ට සිදුවන ඕනෑම වෙනස්කමක් විධිමත් ලෙස ලේඛනගතකර, මණ්ඩලය විසින් අනුමත කර, විකුණුම්කරුගේ ගිවිසුමෙන් පිළිබිඹු විය යුතුය. ඊට අමතරව, පද්ධතිය අපේක්ෂිත මෙහෙයුම් ප්‍රතිලාභ ලබාදෙන බව සහතික කිරීම සඳහා කළමනාකරණය විසින් ක්‍රියාත්මක කරන ලද මොඩියුලවල කාර්යසාධනය සහ භාවිතය සමීපව නිරීක්ෂණය කළ යුතුය.

3.4 මානව සම්පත් කළමනාකරණය

අංකය	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 වර්ෂය තුල සේවකයින් 214 ක් සමාගමෙන් ඉවත්ව ගොස් ඇති අතර එය 2024 ජනවාරි 01 වන දිනට පැවති සේවක සංඛ්‍යාවෙන් සියයට 27.05 ක් නියෝජනය කරයි. එය සමාලෝචිත වර්ෂය තුල සමාගමේ ඉහළ කාර්ය මණ්ඩල පිරිවැටුමක් පෙන්නුම් කරයි.	එම්බීඑස්එල් සමග රැඳී සිටීමට කාර්ය මණ්ඩලය දිරිමත් කිරීම සඳහා සේවකයන්ට ලබාදෙන ප්‍රතිලාභ සහ පහසුකම් වැඩි කරමින් 2025 වර්ෂයේදී එම්බීඑස්එල් සේවක වෘත්තීය සමිතිය සමග සාමුහික ගිවිසුම අවසන් කර අත්සන් කර ඇත. සඳහන් කර ඇති 214 දෙනා අතර ස්ථිර සේවක සංඛ්‍යාවේ 201 දෙනෙකු සහ කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා ඇති අභ්‍යාසලාභීන් 13 දෙනෙකු ඇතුලත් වේ. ඉල්ලා අස් වූ කාර්යමණ්ඩලයෙන් බහුතරය සමාගමේ අලෙවිකරණ කාර්යයන්ට අයත් විය.	සමාගමේ මෙහෙයුම් කටයුතු සුමටව සිදුකිරීමට උපකාරී විය හැකි සමාගම් සේවකයන්ගේ රැකියා තෘප්තිය සහ රඳවා ගැනීම වැඩි දියුණු කිරීම සඳහා සුදුසු පියවර ගැනීම නිර්දේශ කෙරේ.